ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## **PRIDE ආයතනයේ** පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිලධාරි දූත පිරිසක් ඉන්දියාවේ සංචාරයක නිරත වේ (2026 ජූලි 13-17)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිලධාරීන් 24 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2026 ජූලි 13-17 දක්වා නව දිල්ලියේ ප්‍රජාතාන්ත්‍රීය රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනයේ (PRIDE) පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වීම සඳහා ඉන්දිය සංචාරයක නිරත වූහ. මෙම දූත පිරිසේ ප්‍රධානත්වය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් මුදියන්සේලාගේ හංස හේමමාලක සමීර අබේරත්න මහතා විසින් දරන ලදී. මෙම සතියක සංචාරයේ අරමුණ වූයේ ඉන්දියාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ ආයතනික රාමු සහ කමිටු ක්‍රමවේද යනාදිය සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය ලබා දීමයි.

2. මෙම වැඩසටහන PRIDE ආයතනය මගින් පැවැත්වූ පිළිගැනීමේ උත්සවයකින් සහ හඳුන්වාදීමේ වැඩසටහනකින් ආරම්භ වූ අතර ඉන් අනතුරුව පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයේ පරිපාලන ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳව හඳුන්වාදීමක් සිදු කෙරිණ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අත්‍යවශ්‍ය සහයක් ලබා දෙන සුබසාධන, මන්ත්‍රීවරුන්ගේ සේවා සහ මන්ත්‍රීවරුන්ගේ වැටුප් සහ දීමනා ඇතුළු ප්‍රධාන අංශවල කාර්යභාරයන් සම්බන්ධයෙන් වැදගත් කරුණු කාරණා මෙහිදී පැහැදිලි කරන ලදි. පාර්ලිමේන්තු වරප්‍රසාද, ආචාර ධර්ම, නියමාවලීන් සහ රාජ්‍යතාන්ත්‍රික මාර්ගෝපදේශ සහ දෙපාර්තමේන්තුමය වශයෙන් සම්බන්ධ ස්ථාවර කමිටු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය සහ ඒකාබද්ධ සහ තේරීම් ඇතුළු වෙනත් පාර්ලිමේන්තු කමිටුවල ක්‍රියාකාරිත්වය වැනි කරුණු ද සැසිවලදී ආවරණය කරන ලදි.

3. මෙයට අමතරව, ශ්‍රී ලංකා කණ්ඩායම ලේකම් කාර්යාලයේ අයවැය සකස් කිරීම සහ ඒකාබද්ධ මූල්‍ය ඒකකයේ සහ අයවැය සහ පාර්ලිමේන්තු අංශවල කාර්යභාරය පිළිබඳව ද අවබෝධයක් ලබා ගත්හ. ලෝක් සභා සහ රාජ්‍ය සභා ගැලරි සහ පාර්ලිමේන්තුවේ කලා ගැලරිය ඇතුළු ස්ථාන ආවරණය කරමින් පාර්ලිමේන්තු

ගොඩනැගිල්ලේ සංචාරයක් සඳහා පහසුකම් ද සලසා තිබිණ. මේ තුළින් ඉන්දියාවේ පාර්ලිමේන්තු ආයතන සම්බන්ධයෙන් මනා අවබෝධයක් සහභාගීවන්නන්ට ලබා දෙන ලදි. දූත පිරිස ටාජ් මහල් සහ අග්රා බලකොටුව වෙත ද සංචාරය කරමින් ඉන්දීය සංස්කෘතිය ද දැක බලා ගත්හ.

4. මෙම සංචාරය තුළින් පාර්ලිමේන්තු නියැළීම් ශක්තිමත් කිරීම සහ සංවර්ධන අත්දැකීම් බෙදා හදා ගැනීම සඳහා ඉන්දියාවේ සහ ශ්රී ලංකාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු විය. එසේම, එතුළින් දෙරට අතර ආයතනික සහයෝගීතාවයේ සහ ධාරිතා සංවර්ධනයේ වැදගත්කම අවධාරණය කෙරිණ.

***

**කොළඹ**
***2026*** ජූලි ***20***